# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2013 අංක 9 දරන රේගු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 මාර්තු මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 මාර්තු මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2013 අංක 9 දරන රේගු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 මාර්තු මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 24/2013.

**(235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2013 අංක 9 දරන රේගු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:— ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වන වගන්තියේ (1) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (235 වන අධිකාරයවූ) 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1අ) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩයක් මත රේගු බදු පැනවීමට අදාළව හෝ එකී භාණ්ඩ රේගු බද්දෙන් නිදහස් කිරීමට අදාළව හෝ එකී භාණ්ඩ මත හෝ භාණ්ඩ පිළිබඳ පැහැදිලි කිරීම් හෝ විස්තර මත රේගු බදු ගෙවීම හා සම්බන්ධ කොන්දේසියකට හෝ ව්‍යතිරේකයකට අදාළව යම් ආරවුලක් ඇති වන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි එම භාණ්ඩවල ආනයනකරු විසින් හෝ අපනයනකරු විසින් වහාම තීරණය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(1ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ඉල්ලීම ලැබුණු දින සිට දින අනූවක් ඇතුළත (1අ) වගන්තිය යටතේ තමා වෙත යොමු කරන ලද ආරවුල පිළිබඳ තීරණය කළ යුතු ය.

(1ඇ) (අ) අවස්ථාවෝචිත පරිදි ආනයනකරු හෝ අපනයනකරු වෙත (1ආ) වගන්තියේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව ඇතුළත තීරණය දැනුම් දීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා අපොහොසත් වන අවස්ථාවක; හෝ

(ආ) එවැනි තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්—

අවස්ථාවෝචිත පරිදි 1 (ආ) උප වගන්තියේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව අවසන් වීමේ දින සිට හෝ එකී තීරණය ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ බදු අභියාචනා කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.